ස්ථානාධිපති,
පොලිස් ස්ථානය,
නාරාහේන්පිට.
2021.01.21

ආයතන ප්‍රධානී මහත්ම/ මහත්මියන් වෙත.

<u>ආරක්ෂාව සම්බන්ධයෙන් කරනු ලබන දැනුම් දීමයි.</u>

දැනට රටෙහි උද්ගත වී ඇති කොවිඩ් 19 වෛරසය රටතුල සීග්‍රලෙස පැතිරීමේ හේතුවෙන් බන්ධනාගාර ගතකර සිටි විවිධ සණයේ අපරාධ කරුවන් රාශියක් මේ වනවිට බන්ධනාගාර මගින් ඇප ලැබීමෙන් හෝ නිදහස ලැබීමෙන් සමාජ ගත වී ඇත.මෙම පුද්ගලයින් විසින් ඉදිරි කාලයේ නොයෙක් අපරාධ සිදු කිරීමට බොහෝ දුරට ඉඩ ඇත. එබැවින් ඔබ ආයතන තුල පහත සදහන් ආරක්ෂක ක්‍රමවේදයන් අනුගමනය කර ඉදිරියේදී සිදුවිය හැකි අපරාධ රැල්ල මැඩපැවැත්වීම සඳහා දායකත්වය දක්වන මෙන් දැනුම් දෙමි.

- අපරාධ විසදීමේදී සී.සී.ටී.වී.දර්ශන බොහෝ දුරට ඉවහල් වී ඇති හෙයින් ආයතනය තුල සවිකර ඇති සී.සී.ටී.වී. කැමරා පද්ධතිය යාවත් කාලීන කර ක්‍රියාකාරී තත්වයෙහි තබා ගැනීම සහ මේවන විටත් ආයතනය ආවරනය වන පරිදි සී.සී.ටී.වී. කැමරා පද්ධතියක් සවිකර නොමැති නම් කැමරා පද්ධතියක් සවිකර ගැනීමට කටයුතු කිරීම.

- මුදල් ප්‍රවාහනයේදී ආරක්ෂක ක්‍රමවිධි අනුගමනය කරමින් එම කටයුතු සිදු කිරීම සහ මුදල් ප්‍රවාහනය කරන වාහන සඳහා ආරක්ෂක කැමරා පද්ධතියක් හෝ ජී.පී.එස්. යන්ත්‍ර සවි කිරීම.

- ආරක්ෂාව සම්බන්ධයෙන් ඔබ යටතේ සිටින සියළුම සේවක මහත්ම මහත්මීන් දැනුවත් කිරීම.

- ඔබ ආයතනය මගින් යොදවා ඇති ආයතන ආරක්ෂක නිළධාරීන් මේ පිළිබද දැනුවත් කර නිරන්තර අවධානයෙන් සිටීමට උපදෙස් ලබා දෙන්න

- ඔබ ආයතනය වෙත සේවාවන් ලබා ගැනීම සඳහා පැමිනෙන සේවාදායකයින් වංචා කරුවන්ට හසුවීමෙන් නොයෙක් අපහසුතාවයන්ට පත්වීම් සම්බන්ධයෙන් ආයනය තුල දැනුවත් කිරීමේ පුවරු සවි කිරීමේ ක්‍රම වේදයක් සකස් කිරීම.

- ඔබ ආතනයට සේවාවන් ලබා ගැනීම සඳහා පැමිනෙන අයගේ සහ ආයතනයේ සේවය කරනු ලබන අයගේ වාහන, යතුරු පැදි ,ත්‍රිරෝද රථ ගාල් කිරීම සඳහා වෙන්කර ඇති රථගාල් ආවරනය වන පරිදි සී.සී.ටී.වී. කැමරා සවිකිරීම.එම වහන ඇතුලත තබායන වටිනා භාණ්ඩ සම්බන්ධයෙන් ආරක්ෂිත පියවර ගැනීමට දැනුවත් කිරීම.

- ➢ ආයතනය වෙත අතුළුවන පුද්ගලයින්ගේ තොරතුරු සටහන් කර ගැනීමේ ක්‍රම වේදයක් පවත්වාගෙනයාම.
- ➢ ආයතනයතුල හේතුවක් නොමැතිව නිකරුණේ ගැවසෙන පුද්ගලයින් සම්බන්ධයෙන් විමසිලිමත්ව සිටින ලෙසත් එවැනි අය සිටීනම් ආරකෂක අංශය සහ පොලිස් ස්ථනය දැනුවත් කිරිම.
- ➢ ආතනයට පැමිනෙන වාහන හැර වෙනත් වාහන ආයතන පරිශ්‍රයේ ඇති රථගාල් වලට ඇතුළු කිරීමට ඉඩ නොදෙන ලෙසට ආරක්ෂක නිළධාරීන් දැනුවත් කිරීම.
- ➢ පාරිභෝගිකයින් හට සහ සේවා ලබාගැනිම සඳහා පැමිනෙන සේවාදායකයින්ට උදව් උපකාර කිරිමේ අරමුනින් පැමිනෙන තැරැව් කරුවන් සම්බන්ධයෙන් විමස්ලිමත්ව කටයුතු කිරිම.
- ➢ ඔබ ආයතනයේ සේවය කරණ කාන්තා සේවිකාවන් රාජකාරි සදහා පැමිනෙන අවස්ථා වලදී සහ පිටවයන අවස්ථා වලදී යතුරුපැදි වලින් පැමිනෙන නාදුනන පුද්ගලයන් විසින් තොරතුරු විමසන මුවාවෙන් කාන්තාවන්ගේ ගෙලබැදි රන් මාල කොල්ලකෑම් සිදුකරන බැවින් ඒ සම්බන්ධව ආයතනයේ සිටින කාන්තා නිලධාරිණියන් දැනුවත් කරන ලෙසත් එවැනි යතුරුපැදි හා ත්‍රිරෝධරථවල අංකයන් සටහන්කර ගැනිමටද ඔවුන් දැනුවත් කරණ්න.

හදිසි අවස්ථාවකදී ඇමතිය යුතු දුරකථන අංක.

- ✓ 0718591584 ස්ථානාධිපති නාරාහේන්පිට.
- ✓ 0716696554/0779004116 ස්ථානාධිපති අපරාධ විමර්ශන අංශය.
- ✓ 0706006855 ස්ථානාධිපති විවිධ පැමිනිලි අංශය.
- ✓ 0717303522 ස්ථානාධිපති රථ වාහන අංශය.

ස්ථානාධිපති/නාරාහේන්පිට.

ජේ.එස්.කේ. ජයසෙත්ති
ප්‍රධාන පොලිස් පරීක්ෂක
ස්ථානාධිපති
පොලිස් ස්ථානය
නාරාහේන්පිට.